# නෙස්ලේ කිට් කැට් නැවතත් ශ්‍රී ලංකාවේ

## *නෙස්ලේ හි අංක 1 ගෝලීය චොක්ලට් වර්ගය ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් රස ගැන්වීම සඳහා නැවතත් සූදනම්*

ශ්‍රී ලාංකික චොක්ලට් ලෝලින්ගේ මහත් වූ අපේක්ෂාවන් සපුරාලීම සඳහා නැවත දේශීය වෙළෙඳපොළ වෙත පැමිණ ඇති නෙස්ලේ හි වඩාත් ඇලුම් කරන සහ ජාත්‍යන්තර වශයෙන් ජනාදරයට ලක්ව ඇති චොක්ලට් වර්ගයක් වන කිට් කැට් දැන් වඩාත් වැඩි ක්‍රිස්පි ගතියකින් හා ක්‍රීම් රසයකින් යුක්තව ඔබ වෙත එන බව නිවේදනය කර සිටී.

"ලොව ප්‍රමුඛතම චොක්ලට් නිෂ්පාදන සමාගමක් ලෙස තමන් මහත් සේ ඇළුම් කළ චොක්ලට් වර්ගය නැවත පැමිණෙන තුරු මහත් අපේක්ෂාවෙන් පසු වූ ශ්‍රී ලාංකික පාරිභෝගකයින් සඳහා 'කිට් කැට්' වැනි ගෝලීය වශයෙන් පිළිගැන්මට ලක්වූ නිපැයුමක් නැවත හඳුන්වා දීමට අවස්ථාව ලැබීම පිළිබඳව නෙස්ලේ හි අපට මහත් ආඩම්බරයක්. ඒ වගේම ශ්‍රී ලංකාවේ චොක්ලට් නිෂ්පාදන ක්ෂේත්‍රය වෙත වඩාත් පිළිගැනෙන සංකේතාත්මක චොක්ලට් වර්ගයක් සමග නැවත පිවිසීමට ලැබීමද ඉතාම ප්‍රබෝධජනකයි. ඉදිරියේදී අප පාරිභෝගිකයින් ඔවුන්ගේ විවේකය තුළ කිට් කැට් සමග සිනාවකින් පසුවනු දැකීම අපේ අපේක්ෂාවයි." මේ පිළිබඳව තම අදහස් දැක්වූ නෙස්ලේ ලංකා PLC කළමනාකාර අධ්‍යක්ෂ අලොයිස් හොෆ්බවර් මහතා සඳහන් කළේය.

රසැති නෙස්ලේ චොක්ලට් ගැල්වූ ක්‍රිස්පි ගතියෙන් යුත් වේෆර්ස් වලින් යුත් කිට් කැට් ලොව පුරා පාරිභෝගකයින්ගේ ඉහළම ජනප්‍රියත්වයක් දිනා ඇති අතර නෙස්ලේහි අංක 1 චොක්ලට් වර්ගය බවට පත්ව ඇත. විශිෂ්ට රසය හා සුපිරි ගුණාත්මක බව පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්ව ඇති කිට් කැට් *'Have a break, have a KIT KAT* යන පාඨයද සමග ලොව පුරා මහත් සේ ජනප්‍රියත්වයට පත්ව ඇත.

"කිට් කැට් සංකේතාත්මක චොක්ලට් වර්ගයක් වන අතර ගෝලීය චොක්ලට් නිෂ්පාදන වෙළෙඳපොළ තුළ සාර්ථක උරුමයක් සනිටුහන් කිරීමට සමත්ව ඇති නිපැයුමක්. ලොව පුරා සෑම තත්පරයකදීම නෙස්ලේ කිට් කැට් චොක්ලට් බාර් 150ක් පරිභෝජනය කරනු ලබන අතර එය එහි ජනප්‍රියත්වයට හා සාර්ථකත්වයට කදිම නිදසුනක්. නෙස්ලේ ගෝලීය ආහාර හා පාන වෙළෙඳපොලේ ප්‍රමුඛතම භූමිකාවක නිරතවන සමාගම වන අතර අපේ නිපැයුම් පෙළට එක්වූ මෙම නවතම එක්වීම මෙරට අපේ ප්‍රමුඛ තත්ත්වය තවදුරටත් තහවුරු කිරීමට උපකාරී වන බවට කිසිදු සැකයක් නැහැ." මේ පිළිබඳව තම අදහස් දක්වමින් නෙස්ලේ ලංකා PLC හි ජ්‍යෙෂ්ඨ උප සභාපති -වාණිජ මොහොමඩ් හම්සා මහතා පැවසීය.

කිට් කැට් ලෝලීන්ට තම ප්‍රියතම චොක්ලට් වර්ගය ඉතා පහසුවෙන් ලබා ගැනීම සහතික කරමින් 'Good Food, Good Life' යන තේමා පාඨය ඔස්සේ කටයුතු කරන නෙස්ලේ සමාගම දැන් දිවයින පුරා සුපිරි වෙළෙඳසැල්වලින් මෙම නිපැයුම් ලබාගත හැකි බව සඳහන් කළේය. මෙහි නිල බෙදාහරින්නා ලෙස කටයුතු කරන්නේ මිලර්ස් සමාගමයි.

**ඡායාරූපය:**

නෙස්ලේ ලංකා PLC හි කළමනාකාර අධ්‍යක්ෂ අලොයිස් හොෆ්බවර් මහතා නිල වශයෙන් ප්‍රථම කිට් කැට් ඇසුරුම මිලර්ස් සමාගමේ විධායක අධ්‍යක්ෂ ඩෙලානෝ ඩයස් මහතා වෙත බාරදුන් අයුරු ඡායාරූපයේ දැක්වේ. ඡායාරූපයේ වමේ සිට දකුණට කොත්මලේ හෝල්ඩිංග්ස් සමාගමේ විධායක අධ්‍යක්ෂ ජූඩ් ප්‍රනාන්දු සහ නෙස්ලේ ලංකා PLC හි ජ්‍යෙෂ්ඨ උප සභාපති මොහොමඩ් හම්සා යන මහත්වරුද වෙති.